(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 74.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2016 ජුනි මස 07 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **තිලංග සුමතිපාල මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **තලතා අතුකෝරල මහත්මිය,** විදේශ රැකියා අමාත්‍යතුමිය

ගරු **වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා සහ ඉඩම් අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **රවී කරුණානායක මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **මනෝ ගනේසන් මහතා,** ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යතුමා

ගරු **දයා ගමගේ මහතා,** ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **පලනි දිගම්බරම් මහතා,** කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා

ගරු **නවීන් දිසානායක මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **එස්. බී. දිසානායක මහතා,** සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා

ගරු **එස්. බී. නාවින්න මහතා,** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** තිරසර සංවර්ධන හා වනජීවි අමාත්‍යතුමා

ගරු **හරින් ප්‍රනාන්දු මහතා,** විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **ෆයිසර් මුස්තාපා මහතා,** පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **අනුර ප්‍රියදර්ශන යාපා මහතා,** ආපදා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **සාගල රත්නායක මහතා,** නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **අර්ජුන රණතුංග මහතා,** වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා

ගරු **චන්දිම වීරක්කොඩි මහතා,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **මංගල සමරවීර මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **මහින්ද සමරසිංහ මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා

ගරු **ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත් විජයමුණි සොයිසා මහතා,** වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා

ගරු **ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා,** ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. ඒකනායක මහතා,** ඉඩම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මොහාන් ලාල් ග්‍රේරු මහතා,** උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩිලාන් පෙරේරා මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **පාලිත රන්ගේ බණ්ඩාර මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **වී. එස්. රාධක්‍රිෂ්නන් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රුවන් විජයවර්ධන මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** ජාත්‍යන්තර වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා,** පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **දුනේෂ් ගන්කන්ද මහතා,** ආපදා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අනුරාධ ජයරත්න මහතා,** මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුමේධා ජී. ජයසේන මහත්මිය,** තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා,** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මනූෂ නානායක්කාර මහතා,** විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසන්ත පුංචිනිලමේ මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා,** වැවිලි කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරානාත් බස්නායක මහතා,** විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා,** වරාය හා නාවික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රන්ජන් රාමනායක මහතා,** සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩුලිප් විජේසේකර මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අමීර් අලි සිහාබ්දීන් මහතා,** ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. එම්. එම්. හරීස් මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **සිසිර කුමාර අබේසේකර මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා**

ගරු **ආනන්ද අලුත්ගමගේ මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **රංජිත් අලුවිහාරේ මහතා**

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා**

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා**

ගරු **ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය**

ගරු **වේලු කුමාර් මහතා**

ගරු **නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා**

ගරු **චන්දිම ගමගේ මහතා**

ගරු **සිරිපාල ගමලත් මහතා**

ගරු **උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**

ගරු **නිහාල් ගලප්පත්ති මහතා**

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා**

ගරු **බන්දුල ගුණවර්ධන මහතා**

ගරු **එඩ්වඩ් ගුණසේකර මහතා**

ගරු **පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා**

ගරු **ඩී. වී. චානක මහතා**

ගරු **සිසිර ජයකොඩි මහතා**

ගරු **මලිත් ජයතිලක මහතා**

ගරු **නලින් බණ්ඩාර ජයමහ මහතා**

ගරු **අනුර සිඩ්නි ජයරත්න මහතා**

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු ලකී ජයවර්ධන මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු මොහොමඩ් නවවි මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු තිලක් මාරපන මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා

ගරු බිමල් රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු වමල් රාජපක්ෂ මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු අංගජන් රාමනාදන් මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු ඒ. ඒ. විජේතුංග මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු හේෂාන් විතානගේ මහතා

ගරු එස්. වියාලේන්දිරන් මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය

**ගරු සන්දිත් සමරසිංහ මහතා**

**ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

**ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා**

**ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා**

**ගරු මුත්තු සිවලිංගම් මහතා**

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා**

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

**ගරු කනක හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. කථානායකතුමාගේ නිවේදන :** කථානායකතුමා විසින් මතු පළවන නිවේදන කරන ලදී ,—

**I**

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වැනි ව්‍යවස්ථාව අනුව, 2016 මැයි මස 20 වැනි දින - ක්ෂුද්‍රමූල්‍ය නමැති පනත් කෙටුම්පතෙහි ද, 2016 මැයි මස 30 වැනි දින - ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකු ගිවිසුම (අපරානුමත කිරීමේ) නමැති පනත් කෙටුම්පතෙහි ද මවිසින් සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

**II**

"2015 දෙසැම්බර් මස 19 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් යෝජනාව ප්‍රකාරව සහ 2016 පෙබරවාරි මස 25 වැනි දින මවිසින් සිදු කරන ලද නිවේදනයට අමතරව, තේරීම් කාරක සභාව විසින් ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සේවය පිණිස මතු සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීන් පත් කර ඇති බව දන්වනු කැමැත්තෙමි.

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු මලිත් ජයතිලක මහතා"

**III**

"2015 දෙසැම්බර් මස 19 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් යෝජනාව ප්‍රකාරව සහ 2016 පෙබරවාරි මස 25 වැනි දින මවිසින් සිදු කරන ලද නිවේදනයට අමතරව, තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා තිරසර සංවර්ධනය හා පරිසර සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සේවය පිණිස පත් කර ඇති බව දන්වනු කැමැත්තෙමි."

**IV**

"2015 දෙසැම්බර් මස 19 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් යෝජනාව ප්‍රකාරව සහ 2016 පෙබරවාරි මස 25 වැනි දින මවිසින් සිදු කරන ලද නිවේදනයට අමතරව, තේරීම් කාරක සභාව විසින් කාන්තා හා ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සේවය පිණිස මතු සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීන් පත් කර ඇති බව දන්වනු කැමැත්තෙමි.

ගරු සිරිපාල ගමලත් මහතා

ගරු රොෂාන් රණසිංහ මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා"

**V**

"2015 දෙසැම්බර් මස 19 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි 8 (ඇ) සහ (ඉ) ජේද ප්‍රකාරව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවෙහි සාමාජිකත්වයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා ඉවත් කොට, තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මුජිබුර් රහුමාන් මහතා එම කාරක සභාවේ සේවය පිණිස පත් කර ඇති බව දන්වනු කැමැත්තෙමි."

**VI**

"2015 දෙසැම්බර් මස 19 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි 8 (ඇ) සහ (ඉ) ජේද ප්‍රකාරව සෞඛ්‍ය සහ මානව සුභ සාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජිකත්වයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා ඉවත් කොට, තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා එම කාරක සභාවේ සේවය පිණිස පත් කර ඇති බව දන්වනු කැමැත්තෙමි."

**VII**

"2015 දෙසැම්බර් මස 19 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි 8 (ඇ) සහ (ඉ) ජේද ප්‍රකාරව බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවෙහි සාමාජිකත්වයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මලිත් ජයතිලක මහතා සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු විජිත හේරත් මහතා ඉවත් කොට, තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රෝහිත අබේගුණවර්ධන මහතා එම කාරක සභාවේ සේවය පිණිස පත් කර ඇති බව දන්වනු කැමැත්තෙමි."

## VIII

"2015 දෙසැම්බර් මස 19 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි 8 (ඇ) සහ (ඉ) ඡේද ප්‍රකාරව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජිකත්වයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා ඉවත් කොට, තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා එම කාරක සභාවේ සේවය පිණිස පත් කර ඇති බව දන්වනු කැමැත්තෙමි."

## IX

"2015 දෙසැම්බර් මස 19 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි 8 (ඇ) සහ (ඉ) ඡේද ප්‍රකාරව ප්‍රතිසන්ධාන හා උතුර හා නැගෙනහිර නැවත ගොඩනැඟීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජිකත්වයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු තාරානාත් බස්නායක මහතා ඉවත් කොට, තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු බිමල් රත්නායක මහතා එම කාරක සභාවේ සේවය පිණිස පත් කර ඇති බව දන්වනු කැමැත්තෙමි."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම : (1)** කථානායකතුමා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වැනි ව්‍යවස්ථාව ප්‍රකාර 2011 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ අටවැනි කාණ්ඩයේ IV වැනි කොටස; 2012 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ හයවැනි කාණ්ඩයේ XXIV වැනි කොටස; 2013 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ VIII වැනි කොටස, දෙවැනි කාණ්ඩයේ XIX වැනි කොටස, හතරවැනි කාණ්ඩයේ VI, VII, VIII, IX සහ X වැනි කොටස්, පස්වැනි කාණ්ඩයේ VII වැනි කොටස සහ හයවැනි කාණ්ඩයේ I, II, III, IV සහ V වැනි කොටස්; 2014 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ I සහ II වැනි කොටස්, දෙවැනි කාණ්ඩයේ VI, VII, VIII, IX සහ X වැනි කොටස්, තුන්වැනි කාණ්ඩයේ III වැනි කොටස, හතරවැනි කාණ්ඩයේ VI සහ VII වැනි කොටස් සහ පස්වැනි කාණ්ඩයේ I, II සහ III වැනි කොටස් පිළිගන්වන ලදී.

එම වාර්තා **සභා මේසය** මත තැබිය යුතුයැයි ද මුද්‍රණය කළ යුතුයැයි ද නියෝග කරන ලදී.

(2) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් 2015 වර්ෂය සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ආර්ථික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) ස්වදේශ කටයුතු අමාත්‍යතුමා විසින්

(i) 2015 වර්ෂය සඳහා ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යසාධන වාර්තාව සහ ගිණුම්;

(ii) 2015 වර්ෂය සඳහා යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්යසාධන හා ගිණුම් වාර්තාව;

(iii) 2015 වර්ෂය සඳහා කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව සහ ගිණුම්;

(iv) 2015 වර්ෂය සඳහා කිළිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යසාධන හා වාර්ෂික ගිණුම් වාර්තාව;

(v) 2015 වර්ෂය සඳහා මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යසාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම්; සහ

(vi) 2015 වර්ෂය සඳහා මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යසාධන වාර්තාව හා ගිණුම්

පිළිගන්වා, එම වාර්තා අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් 2015 අංක 16 දරන විසර්ජන පනතේ 6 (1) වැනි වගන්තිය යටතේ 2016.05.17 දිනට ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම - 2016 පිළිගන්වන ලදී.

එම වාර්තාව **සභා මේසය** මත තැබිය යුතුයැයි නියෝග කරන ලදී.

(5) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්—

(i) 2013 වර්ෂය සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2014 වර්ෂය සඳහා ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව

පිළිගන්වා, එම වාර්තා කාන්තා හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමුකළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) අධ්‍යාපන අමාත්‍යතුමා විසින් 2014 වර්ෂය සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමුකළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් 2015 වර්ෂය සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමුකළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. පෙත්සම් :**

(1) (i) ගාල්ල, වක්වැල්ල, 127/4/බී දරන ස්ථානයෙහි පදිංචි එරන්ද විජයසිරි කටුකුරුන්ද ගමගේ මහතාගෙන් ලැබුණු 2015.12.04 දිනැති පෙත්සම;

(ii) ගාල්ල, අංකොක්කාවල, වැලිකැටිය, “මහ ගෙදර” යන ලිපිනයෙහි පදිංචි ඉනෝකා ගීගනගේ මෙනවියගෙන් ලැබුණු 2016.01.09 දිනැති පෙත්සම;

(iii) අහංගම, කතලුව, ගුරුකන්ද, “තරිඳු” යන ලිපිනයෙහි පදිංචි නීතා වික්‍රමසූරිය මහත්මියගෙන් ලැබුණු 2016.01.30 දිනැති පෙත්සම;

(iv) බලපිටිය, බ්‍රාහ්මණවත්ත, "හේමානි" යන ලිපිනයෙහි පදිංචි එස්. පී. කේ. ද සිල්වා මහතාගෙන් ලැබුණු 2015.10.08 දිනැති පෙත්සම; සහ

(v) ගාල්ල, හියාරේ, පේරලන්ද වත්ත, "තුෂාරා" යන ලිපිනයෙහි පදිංචි වී. පී. චලනා ජානකී ජයවර්ධන මෙනවියගෙන් ලැබුණු 2016.01.09 දිනැති පෙත්සම

ගරු චන්දිම වීරක්කොඩි මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) මාලබේ, සුසිලාරාම පාර, අංක 500 දරන ස්ථානයෙහි පදිංචි ඩී. ගුණදාස මහතාගෙන් ලැබුණු 2016.03.17 දිනැති පෙත්සම;

(ii) කඩුවෙල, පහළ බෝමිරිය, අංක 362 දරන ස්ථානයෙහි පදිංචි එච්. ඒ. එන්. පෙරේරා මහතාගෙන් ලැබුණු 2016.04.06 දිනැති පෙත්සම;

(iii) කඩුවෙල, වැලිවිට, අංක 152 දරන ස්ථානයෙහි පදිංචි ජේ. කේ. ඒ. ඩී. ඉන්ද්‍රසිරි ජයවර්ධන මහතාගෙන් ලැබුණු 2016.02.25 දිනැති පෙත්සම;

(iv) අංගොඩ, අග්ගෝන, අංක 517/1 දරන ස්ථානයෙහි පදිංචි කේ. බී. ඩබ්ලිව්. අල්විස් මහතාගෙන් ලැබුණු 2016.03.09 දිනැති පෙත්සම;

(v) කොළඹ 01, පොලිස් මූලස්ථානයේ සේවය කරන, පොලිස්පති මාණ්ඩලික සහකාර, පොලිස් අධිකාරී එල්. එන්. පී. ජයරත්න මහතාගෙන් ලැබුණු 2016.03.24 දිනැති පෙත්සම;

(vi) කොළඹ 03, කොල්ලුපිටිය, 10 වෙනි පටුමග, අංක 20 ඒ දරන ස්ථානයෙහි පදිංචි එම්. එස්. ඒ. ෆාරුක් මහතාගෙන් ලැබුණු 2016.01.06 දිනැති පෙත්සම;

(vii) කඩවත, ගනේමුල්ල පාර, සෙත්සිරි උයන, අංක 327/33 දරන ස්ථානයෙහි පදිංචි ප්‍රදීප් වෙත්තසිංහ මහතාගෙන් ලැබුණු 2016.03.30 දිනැති පෙත්සම;

(viii) බත්තරමුල්ල, දියවන්නා උද්‍යාන මාවත, අංක 116 දරන ස්ථානයෙහි පදිංචි ආර්. එම්. විනීතා අයිරාංගනී මහත්මියගෙන් ලැබුණු 2016.02.05 දිනැති පෙත්සම;

(ix) නිට්ටඹුව, රදාවඩුන්න, විහාර මාවත, අංක 160/ඒ දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. ඒ. ඉඳුනිල් ප්‍රියන්ත කුමාර මහතාගෙන් ලැබුණු 2016.03.09 දිනැති පෙත්සම; සහ

(x) කොළඹ 10, මරදාන, පොලිස් නිවාස, අංක බී 9 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. එම්. අතුල බණ්ඩාර මහතාගෙන් ලැබුණු 2016.03.14 දිනැති පෙත්සම

ගරු සුජීව සේනසිංහ මහතා විසින් පිළිගන්වන ලදී.

(3) (i) ත්‍රිකුණාමලය, 5 කණුව, චීන වරාය, රේවත වටරවුම් පාර, අංක 544/59 ඒ දරන ස්ථානයෙහි පදිංචි ඒ. ජී. අමිත් චන්දන කුමාර මහතාගෙන් ලැබුණු 2016.03.17 දිනැති පෙත්සම;

(ii) පදවි - ශ්‍රී පුර, කාවන්තිස්සපුර, අංක 882 දරන ස්ථානයෙහි පදිංචි බී. එම්. ප්‍රියංගිකා සුභාෂිණී මහත්මියගෙන් ලැබුණු 2016.03.03 දිනැති පෙත්සම;

(iii) ගොඩකවෙල, ගලහිටිය, වූලපාය යන ලිපිනයෙහි පදිංචි ඩී. කේ. රණසිංහ මහතාගෙන් ලැබුණු 2016.03.15 දිනැති පෙත්සම;

(iv) ත්‍රිකුණාමලය, චීන වරාය, නුවර පාර, ශ්‍රී බෝධිපාදපාරාමය යන ලිපිනයෙහි පදිංචි ඊ. සජිත් එදිරිසිංහ මහතාගෙන් ලැබුණු 2016.03.16 දිනැති පෙත්සම;

(v) යක්කල, මහවිට, විගොඩ පාර, අංක 94 දරන ස්ථානයෙහි පදිංචි අයි. ආර්. එස්. කුමාරතුංග මහතාගෙන් ලැබුණු 2016.03.30 දිනැති පෙත්සම;

(vi) කොළඹ, කොටුව, බැස්ටියන් මාවත, දුම්රිය නිල නිවාස, අංක 78/15 ඒ දරන ස්ථානයෙහි පදිංචි ජේ. එම්. එන්. එස්. ජයසේන මහතාගෙන් ලැබුණු 2016.04.18 දිනැති පෙත්සම;

(vii) ත්‍රිකුණාමලය, ආන්දම්කුළම, ගෙවල් 10 පාර දරන ස්ථානයෙහි පදිංචි එම්. කැළුම් දර්ශන ද සිල්වා මහතාගෙන් ලැබුණු 2016.03.16 දිනැති පෙත්සම;

(viii) කින්නියා - 06, පෙරුන්තේරු යන ලිපිනයෙහි පදිංචි එම්. එම්. මොහොමඩ් අන්වර් මහතාගෙන් ලැබුණු 2016.03.17 දිනැති පෙත්සම;

(ix) කන්තලේ, රජ ඇල, යුනිට් 4, අංක 668/සී දරන ස්ථානයෙහි පදිංචි ආර්. ජී. මංගලිකා මහත්මියගෙන් ලැබුණු 2016.04.20 දිනැති පෙත්සම;

(x) කින්නියා - 06, පෙරුන්තේරු යන ලිපිනයෙහි පදිංචි එස්. ඒ. ෆස්මීර් මහතාගෙන් ලැබුණු 2016.03.17 දිනැති පෙත්සම;

(xi) ත්‍රිකුණාමලය, චීන වරාය, ධීවර ගම්මානය, අංක 22/1 දරන ස්ථානයෙහි පදිංචි එස්. එම්. ජනිත ලසන්ත මහතාගෙන් ලැබුණු 2016.03.16 දිනැති පෙත්සම;

(xii) ත්‍රිකුණාමලය, බක්මීගම, මැදවච්චිය, "වාසනා ටෙක්ස්" යන ලිපිනයෙහි පදිංචි එස්. කේ. විජේනායක මහතාගෙන් ලැබුණු 2016.04.22 දිනැති පෙත්සම;

(xiii) කන්තලේ, වෙන්ඩ්‍රාසන්පුර, 51 වැනි ඒකකය, අංක 1039 සී දරන ස්ථානයෙහි පදිංචි එස්. එස්. එල්. සේනාධීර මහතාගෙන් ලැබුණු 2016.03.04 දිනැති පෙත්සම;

(xiv) ත්‍රිකුණාමලය, චීන වරාය, නුවර පාර, 5 කණුව දරන ස්ථානයෙහි පදිංචි ටී. ජී. අජිත් කුමාර මහතාගෙන් ලැබුණු 2016.03.17 දිනැති පෙත්සම;

(xv) අම්පිටිය කන්ද, අංක 205/25 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. එම්. මල්ලිකා ජයවර්ධන මහත්මියගෙන් ලැබුණු 2016.03.04 දිනැති පෙත්සම; සහ

(xvi) පාදුක්ක, අරුක්වත්ත, මහාමායා පෙදෙස යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. ඒ. ඩී. ඩබ්ලිව්. කේ. වික්‍රමසිංහ මහත්මියගෙන් ලැබුණු 2016.03.30 දිනැති පෙත්සම

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා විසින් පිළිගන්වන ලදී.

(4) (i) තිනියාවල, කටුකැන්ද පාර යන ලිපිනයෙහි පදිංචි ඒ. ඒ. සුනිල් මහතාගෙන් ලැබුණු 2016.02.20 දිනැති පෙත්සම;

(ii) බුලත්සිංහල, මධ්‍ය මහා විද්‍යාල පාර යන ලිපිනයෙහි පදිංචි ලියනගේ ඩේසි පෙරේරා මහත්මියගෙන් ලැබුණු 2016.03.19 දිනැති පෙත්සම;

(iii) ගුරුබැද්ද, හැඩිගල්ල, වත්තහේන යන ලිපිනයෙහි පදිංචි එම්. ඒ. යෙස්ලි රත්නසිරි මහතාගෙන් ලැබුණු 2016.02.24 දිනැති පෙත්සම;

(iv) අයගම, ගවරගිරය, වතුකාරගම යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. නීල් පියන්ත ප්‍රේමනන්ද මහතාගෙන් ලැබුණු 2016.03.28 දිනැති පෙත්සම; සහ

(v) මතුගම, වැත්තෑව, මාර්ග සංවර්ධන අධිකාරියේ නිවාස යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. සෝමසිරි අල්විස් මහතාගෙන් ලැබුණු 2016.03.21 දිනැති පෙත්සම

ගරු පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා විසින් පිළිගන්වන ලදී.

(5) (i) මහකෙලිය, නිසලතැන්න, 5 වන පටුමග, අංක 284 දරන ස්ථානයෙහි පදිංචි කේ. එම්. සී. කුලතුංග මහතාගෙන් ලැබුණු 2016.02.22 දිනැති පෙත්සම; සහ

(ii) මහවැව, ඉහළ මහවැව, අංක 327/C දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. පී. සරත් හේමසිරි වික්‍රමනායක මහතාගෙන් ලැබුණු 2016.01.11 දිනැති පෙත්සම

ගරු අනුර දිසානායක මහතා විසින් පිළිගන්වන ලදී.

(6) (i) බණ්ඩාරවෙල, හීල්ඔය, කලුගස් අරාව, වෙහෙරගලතැන්න, අංක 55 දරන ස්ථානයෙහි පදිංචි සී. ඒ. ඩී. අමරාන්න ද මෙල් මහතාගෙන් ලැබුණු 2016.02.10 දිනැති පෙත්සම;

(ii) බදුල්ල, ගහබඩ පටුමාවත, අංක 14/8 දරන ස්ථානයෙහි පදිංචි ආර්. ජී. ආරියරත්න මහතාගෙන් ලැබුණු 2016.02.23 දිනැති පෙත්සම; සහ

(iii) වැබඩ, ගෝනහේන, අංක 97/3 දරන ස්ථානයෙහි පදිංචි වයි. ඩබ්ලිව්. පියදාස මහතාගෙන් ලැබුණු 2016.04.06 දිනැති පෙත්සම

ගරු නිහාල් ගලප්පත්ති මහතා විසින් පිළිගන්වන ලදී.

(7) (i) හික්කඩුව, ගාලු පාර, අංක 185 දරන ස්ථානයෙහි පදිංචි අජිත් ගුණවර්ධන මහතාගෙන් ලැබුණු 2016.02.11 දිනැති පෙත්සම;

(ii) අක්මීමණ, කපුහෙම්පල, පුවක්ගහකනත්තවත්ත, "නමුණු" යන ලිපිනයෙහි පදිංචි බී. පී. සී. නෙවිල් ද සිල්වා මහතාගෙන් ලැබුණු 2015.03.02 දිනැති පෙත්සම;

(iii) පොළොන්නරුව, ජයන්තිපුර, අංක 377 දරන ස්ථානයෙහි පදිංචි ඊ. සුනිල් සාන්ත මහතාගෙන් ලැබුණු 2016.01.24 දිනැති පෙත්සම;

(iv) උළුවිටිකේ, කොටඨාසවත්ත යන ලිපිනයෙහි පදිංචි එච්. ඒ. එස්. නානායක්කාර මහතාගෙන් ලැබුණු 2016.03.01 දිනැති පෙත්සම;

(v) නුගේගොඩ, පාගොඩ, පළමුවැනි හරස් වීදිය, අංක 52/2 දරන ස්ථානයෙහි පදිංචි ජේ. සී. එල්. බණ්ඩාර මහතාගෙන් ලැබුණු 2016.02.01 දිනැති පෙත්සම;

(vi) හෝමාගම, කටුවාන පාර, ප්‍රගති මාවත, අංක 236/5 දරන ස්ථානයෙහි පදිංචි කේ. එම්. ලෝලිම්බවංශ මහතාගෙන් ලැබුණු 2016.02.29 දිනැති පෙත්සම;

(vii) පිළියන්දල, දැල්තර, අංක. 273 දරන ස්ථානයෙහි පදිංචි එම්. ටී. පී. කුරේ මහතාගෙන් ලැබුණු 2016.02.28 දිනැති පෙත්සම;

(viii) අනුරාධපුර, ශ්‍රීමත් මාවත, අංක 15/624 දරන ස්ථානයෙහි පදිංචි එම්. ආර්. විජේකුමාර මහතාගෙන් ලැබුණු 2016.03.19 දිනැති පෙත්සම; සහ

(ix) බදුල්ල, කැප්පෙටිපොළ පාර, පළමු පටුමඟ, අංක 12/4 දරන ස්ථානයෙහි පදිංචි යූ. ආර්. සී. දර්ශන මහතාගෙන් ලැබුණු 2016.02.10 දිනැති පෙත්සම

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා විසින් පිළිගන්වන ලදී.

(8) (i) තංගල්ල, කදුරුපොකුණ, සියඹලගහහේන යන ලිපිනයෙහි පදිංචි එම්. කේ. බී. ජයසේකර මහතාගෙන් ලැබුණු 2016.03.03 දිනැති පෙත්සම;

(ii) මාතර, ඉසදීන් නගරය, ශ්‍රී රතනපාල මාවත, අංක 65/16 දරන ස්ථානයෙහි පදිංචි පී. කේ. පත්මා මහත්මියගෙන් ලැබුණු 2016.02.23 දිනැති පෙත්සම; සහ

(iii) වැලිගම, සද්ධානන්ද මාවත, අංක 24/3 දරන ස්ථානයෙහි පදිංචි පී. කේ. සී. විමලසූරිය මහතාගෙන් ලැබුණු 2016.02.20 දිනැති පෙත්සම

ගරු බුද්ධික පතිරණ මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 25අ දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**4. නොපැමිණීමේ අවසරය :** ගරු මුත්තු සිවලිංගම් මහතා, ගරු සී. බී. රත්නායක මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 66 (ඊ) ව්‍යවස්ථාව යටතේ, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ආරුමුගන් තොණ්ඩමන් මහතාට 2016 ජූනි මස 07 වැනි දින සිට මාස තුනක් තුළ පාර්ලිමේන්තුවේ රැස්වීම්වලට නොපැමිණීමට අවසර දිය යුතුය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. හෝමියෝපති :** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— හෝමියෝපති වෛද්‍ය සභාව පිහිටුවීම සඳහා ද, හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් සහ හෝමියෝපති ඖෂධවේදීන් ලියාපදිංචි කිරීම සඳහා ද, හෝමියෝපති ආයතන ලියාපදිංචි කිරීම හා නියාමනය කිරීම සඳහා ද, හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය කිරීම, පෝෂණය කිරීම සහ නියාමනය කිරීම සඳහා මෙන්ම හෝමියෝපති බෙහෙත් වර්ග, ඖෂධ සහ අනෙකුත් හෝමියෝපති පිළියෙල කිරීම් නිෂ්පාදනය, ආනයනය, ගබඩා කිරීම, විකිණීම සහ බෙදාහැරීම නියාමනය කිරීම සහ පාලනය කිරීම සඳහා ද, 1970 අංක 7 දරන හෝමියෝපති පනත ඉවත් කිරීම සඳහා ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද, විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2016 ජූනි මස 21 වැනි අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද නියෝග කරන ලදී.

**6. සමථ මණ්ඩල (සංශෝධන) :** අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා වෙනුවෙන් පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2016 ජූනි මස 21 වැනි අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද නියෝග කරන ලදී.

**7. පාර්ලිමේන්තුවේ රැස්වීම් :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුව විසින් 2016.03.08 වැනි දින සම්මත කරන ලද යෝජනාවේ විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, අද දින පාර්ලිමේන්තුවේ රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 6.30 දක්වා විය යුතු ය. අ. භා. 2.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7(5) ඡේදය ක්‍රියාත්මක විය යුතු ය. අ. භා. 6.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල්තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා, ගරු බිමල් රත්නායක මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ජනකරලිය සංස්කෘතික පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත අධ්‍යාපන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

**9. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා, ගරු කේ. කේ. පියදාස මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය වෙත පවරන ලදී.

**10. කල් තැබීම (අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ මතුව ඇති ගැටලු) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි පාර්ලිමේන්තුවේ සභානායකතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

"ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය යුතුය"යි උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 2.35 ට ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.)

"ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය යුතුය"යි වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 3.40 ට ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.)

(අ. භා. 5.30 ට නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ. භා. 6.40 ට, 2016 ජූනි මස 08 වැනි බදාදා අ. භා. 1.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.